## කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

### ප්‍රධාන කාර්යාලය

**වගා සහනාධාර චක්‍රලේඛ අංක : 78**

අපේ අංකය: සං/01
2019.03.19

සියළුම ප්‍රාදේශීය කළමණාකරුවන් වෙත,

**වැව්ලි සවියෙන් සසුනට එළියක් වැඩසටහන**

පස පුනරුත්ථාපනයෙන් තොරව තේ නැවත වගා කිරීමට අදාලව 2018.07.26 දින නිකුත් කරන ලද වගා සහනාධාර චක්‍රලේඛ අංක:76 හි සඳහන් උපදෙස් වලට වැඩිමනත්වයි.

උක්ත චක්‍රලේඛ උපදෙස් අනුව ක්‍රියාත්මක කරන පස පුනරුත්ථාපනයෙන් තොරව තේ නැවත වගා කිරීම යටතේ හිමිකම් ඇත්තේ ඉඩම් අයිතිය අක්කර 01 ක් හෝ ඊට අඩු බිම් ප්‍රමාණයක් හිමි කුඩා තේ වතු හිමියන්ට පමණි. එහෙත් විශේෂ ව්‍යාපෘතියක් සේ සලකා වැව්ලි සවියෙන් සසුනට එළියක් වැඩසටහන යටතේ පමණක් අක්කර 1 ට වැඩි ඉඩම් සඳහාද පස පුනරුත්ථාපනයෙන් තොරව තේ නැවත වගා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාදී ඇත.

ඒ අනුව උක්ත වැඩසටහන යටතේ පමණක් අක්කර 1 ට වැඩි ඉඩම් සඳහා පස පුනරුත්ථාපනයෙන් තොරව තේ නැවත වගා කිරීමට අනුග්‍රහය ලබාදෙන අතර, ඒ අනුව කටයුතු කරන මෙන් දන්වමි.

මෙම චක්‍රලේඛය ලද බවත් ඒ අනුව ක්‍රියාකරන බවත් සනාථ කලයුතුය. මේ පිළිබඳව ඔබගේ සියළුම කාර්යමණ්ඩලය දැනුවත් කල යුතු වේ.

**දේශබන්දු විජේරත්න දෙවගෙදර**
සභාපති

**පිටපත්:**

1. සාමාන්‍යාධිකාරී
2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන/ව්‍යාප්ති)
3. කළමණාකරු (සංවර්ධන)
4. කළමණාකරු (මානව සම්පත්)
5. කළමණාකරු (මුදල්)
6. අභ්‍යන්තර විගණක
7. ව්‍යාපෘති අධ්‍යක්ෂක - ස්ටාර් ව්‍යාපෘතිය
8. සියළුම මාණ්ඩලික නිලධාරීන්
9. සියළුම කාර්යභාර නිලධාරීන්
10. සියළුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්
11. ගරු ලේකම් - සමස්ථ ලංකා සංවිධානය
12. ගරු ලේකම්වරුන් - සියළුම ප්‍රදේශීය සංවිධාන